**10 ශ්‍රේණිය.**
**සිංහල භාෂාව හා සාහිත්‍යය**
**දෙවෙනි වාරය - තුන්වෙනි සතිය.**

<u>ක්‍රියාකාරකම.</u>

1. පහත දැක්වෙන පාඨය වචන 40 - 45 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

භාෂාව මානව සංස්කෘතියේ පදනම වශයෙන් සැලකෙයි. මිනිසා සත්ත්ව ලෝකයේ සෙසු සාමාජිකයන්ට වඩා විශිෂ්ට තත්ත්වයක් අත් පත් කර ගෙන ඇත්තේ ද භාෂා ශක්‍යතාව හේතුවෙනි. භාෂාවේ විභව්‍යතා උපයෝගී කර ගත් මිනිසා ජීව ලෝකය මෙන් ම ද්‍රව්‍ය ලෝකය ද පාලනය කිරිමේ ශක්තිය තමා සතු කර ගෙන තිබේ. මේ නිසා භාෂාවේ විවිධතා, විෂමතා හැදෑරිම මානව සමාජයේ උන්නතියට හේතු වන කරුණකි. ශ්‍රී ලංකාවේ උප භාෂාමය ව්‍යවහාර හා පරිමිත භාෂා ආශ්‍රිත ව්‍යවහාරයන් අතර ඒ ඒ අවස්ථවන්හි දී විවිධ සම විසමතාවන් දක්නට ලැබීම සාමාන්‍ය තත්ත්වයකි. වර්තමානය වන විට ප්‍රාදේශික හා සමාජීය උපභාෂාමය ව්‍යවහාර භාවිතයෙන් ඈත් වන ආකාරය දැක ගත හැකිය. බහුජන සන්නිවේදන මාධ්‍ය ව්‍යාප්තිය හේතුවෙන් සම්මත ව්‍යවහාර ප්‍රචලිත වීමත් සමාන අධ්‍යාපන අවස්ථා මගින් එකම පෙළ පොත් රටපුරා භාවිතයත් සමඟින් සම්මත ලේඛන ව්‍යවහාරයක් ඇතිවීමත් ඊට ප්‍රධාන වශයෙන් ම හේතු වී තිබේ.

(ලකුණු 10)

උපදෙස්:-

- පළමුව දී ඇති ඡේදය හොඳින් කියවන්න.
- එහි ඇති ප්‍රධාන අදහස් එක යට එක වාක්‍ය වශයෙන් ලියාගන්න.
- දැන් ඔබ ලියූ වාක්‍යවල ඇති වචන සංඛ්‍යාව දී ඇති වචන සංඛ්‍යාවට සමපාත වන්නේදැයි බලන්න.
- එසේ නොවන්නේනම් වචන සංඛාවට සමපාත වන සේ කෙටුම්පත් කරගන්න.
- දැන් ඔබගේ සාරාංශය තනි ඡේදයක් වන සේ ලියන්න.
- ඔබගේ සාරාංශයේ ඇති වචන සංඛ්‍යාව ඔබ ලියූ සාරංශය අග පැහැදිලි ව ලියා දක්වන්න.

* * *

සැකසුම
ජගත් කුමාර ජයසිංහ
ගුරු උපදේශක
දෙහිඕවිට අධ්‍යාපන කලාපය